**වර්ෂ 2025 ක් වූ දෙසැම්බර් මස 09 වන දින පෙ.ව. 9.30 ට පවත්වන්නට යෙදුණු තවලම ප්‍රාදේශීය සභාවේ 7 වන සභා වාරයේ හත්වන මහ සභා රැස්වීමේ වාර්තාවයි.**

**01. පැමිණීම**

1. ගරු සභාපති, සාංචිහාමිලාගේ දේශාන් මධුසංක මැතිතුමා
2. ගරු උප සභාපති, වික්‍රමනායක කරුණාරත්න ගාමිණී කරුණාරත්න මැතිතුමා
3. ගරු සභික, උඩුමලගල ගමගේ සමන් කුමාර මැතිතුමා
4. ගරු සභික, නානායක්කාර ජාගොඩගේ නිශාන්ත මැතිතුමා
5. ගරු සභික, දාම්මල ලියනගේ සෝමා ලියනගේ මැතිණිය
6. ගරු සභික, පෝංගිලිය ගමගේ දර්ශනී සාවිත්‍රි මැතිණිය
7. ගරු සභික, පහල ගමගේ රංජිත් මැතිතුමා
8. ගරු සභික, දාම්මල ලියනගේ අජිත් කුමාර මැතිතුමා
9. ගරු සභික, යසන්ත සමීර සේනානායක මැතිතුමා
10. ගරු සභික, අබේගුණවර්ධන කෝරලේ ආරච්චිගේ අමිල මැතිතුමා
11. ගරු සභික, කාරියවසම් පතිරගේ රත්නසිරි ප්‍රියන්ත මැතිතුමා
12. ගරු සභික, පඹගොඩ පතිරණගේ චන්දන මැතිතුමා
13. ගරු සභික, සිල්වත්ගෙයි සෝමරත්න මැතිතුමා
14. ගරු සභික, ගංගොඩ ලියනගේ සම්පත් රුවන් කුමාර මැතිතුමා
15. ගරු සභික, සුදේශ් රවීන්ද්‍ර සමරවික්‍රම මැතිතුමා
16. ගරු සභික , වික්‍රමනායක කරුණාරත්න සෝමා හේමකාන්ති මැතිණිය
17. ගරු සභික, හේමන්ත කුමාර විදානපතිරණ මැතිතුමා
18. ගරු සභික, වලාකුළු ගමගේ ආරියවති මැතිණිය
19. ගරු සභික, වරුෂ කොන්ඩගේ තුෂාර සම්පත් මැතිතුමා
20. ගරු සභික, යක්දෙහි කන්දගේ රුවන් ඉන්දික මැතිතුමා

**නොපැමිණීම**

නැත

**02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම**

සභා රැස්වීම ආරම්භ වීමට ප්‍රථම ලැබීමට සලස්වන ලද පසු ගිය සභා රැස්වීමේ සභා වාර්තාව කියවූවා සේ සළකා සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් නැතිනම් සභා සම්මත කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

අඩු පාඩු හා දෝෂ සංශෝධන රහිතව මෙම වාර්තාව සභා සම්මත විය යුතු බව ගරු සභාපති, සංචිහාමිලාගේ දේශාන් මධුසංක මැතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු සභික, රංජිත් ගමගේ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

**03. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

I. පහුගිය දිනවල රටටම අයහපත් ලෙස බල පෑ 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් මියගිය පිරිස වෙනුවෙන් තවලම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු සභික මහත්මීන්ගේ ශෝකය ප්‍රකාශ කර සිටින බවත් ඒ වෙනුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවක් ආරක්ෂා කරන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

II. ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවට 03/2025 ස්වදේශ කටයුතු චක්‍රලේඛයට අනුව සභාපතිධුරය හිමි කණ්ඩායමට අයත් නොවන සභාව නියෝජනය කරන නියෝජිතයින් දෙදෙනෙකුට සහභාගී වීමට හැකියාව පවතින බව ප්‍රාදේශීය ලේකම්තුමා කළ දැනුම් දීමකට අනුව ගරු සභික, සුදේශ් රවින්ද්‍ර සමරවික්‍රම මැතිතුමා හා ගරු සභික, වලාකුළු ගමගේ ආරියවතී මැතිණිය නම් කර යැවූ බවත්, ඒ අනුව ඉදිරි රැස්වීම් සඳහා එම දෙදෙනාට සහභාගී වීමට හැකියාව පවතින බවත්, මේ මාසයට අදාළ රැස්වීම 11 වන දින සවස 1.00ට තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැත්වෙන බවත් ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

III. පසුගිය දිනවල ගාල්ල මාතර දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් පැවති ගංවතුර තත්වය හේතුවෙන් තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් යම් කොට්ඨාස ගංවතුර අවදානමකට ලක් වූ බවත්, එහිදී උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ට අදාළ විභාග මධ්‍යස්ථාන කරා ළඟා වීමට අපහසු වූ බැවින් ඒ වෙනුවෙන් ට්‍රැක්ටර් රථ, බෝට්ටු යොදාගෙන නියමිත වෙලාවට ප්‍රථම ළමුන්ව විභාග මධ්‍යස්ථානයන්ට යොමු කිරීමට තවලම ප්‍රාදේශීය සභාවට හැකියාව ලැබුණු බවත්, ඒ සඳහා සහයෝගය ලබා දුන් තවලම ප්‍රාදේශීය ලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මණ්ඩලය, හිනිදුම පොලිස් ස්ථානාධිපතිතුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලය, ආපදා කළමනාකරණ කමිටුව හා නාවික හමුදා කාර්ය මණ්ඩලය, ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය, බල ප්‍රදේශයේ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි සේවය කරන රාජ්‍ය නිලධාරින් හා සහයෝගය ලබා දුන් ප්‍රාදේශීය සභාවේ සභික මහත්ම මහත්මීන් වෙත ස්තුතිය පුද කරන බව ගරු සභාපතිතුමා නිවේදනය කරන ලදී.
එමෙන්ම තවලම බල ප්‍රදේශය තුළ ඇති වූ ගංවතුර අවදානම සමඟ මිනිස් ජීවිත හා දේපළ රැකගැනීම වෙනුවෙන් ස්ථාන බොහොමයක අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම සිදු වූ බවත්, ඒ සඳහා සහයෝගය ලබා දුන් සභාවේ ලේකම්තුමිය හා සංවර්ධන නිලධාරි යූ.කේ.ඒ.ආරච්චි මහතා ප්‍රමුඛ කනිෂ්ඨ කාර්ය මණ්ඩලයට විශේෂ ස්තුතිය පුද කරන බවත්, ගරු සභාපතිතුමා තවදුරටත් නිවේදනය කරන ලදී.

IV. 2025 වර්ෂයේ නොවැම්බර් මස 27 වන දින ආරම්භ වූ ශ්‍රී ලාංකීය ජනතාව මෑතකදී මුහුණ දුන් විශාලම ආපදාව වන 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් අප රටේ ප්‍රදේශ රැසක ගංවතුර හා නාය යාම නිසා විශාල ප්‍රමාණයක් ජීවිත හා දේපළ හානි වාර්තාවීමත් සමඟ ගාලු දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන මූලික කරගනිමින් 'ස්නේහයේ සත්කාරක යාත්‍රා' වැඩසටහන ක්‍රියාත්මක වූ බවත්, ඒ අනුව ගාලු දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට භාර දුන් මහනුවර දිස්ත්‍රික්කයට අවශ්‍ය සේවාව ලබා දීම සඳහා තවලම ප්‍රාදේශීය සභාව නියෝජනය කරමින් මේ වන විට කණ්ඩායම් තුනක් අදියරෙන් අදියර සහභාගී වී ඇති බවත්, ඒ සඳහා සහභාගී වූ සභික මහත්වරුන්, කාර්යාලයේ නිලධාරින් ඇතුළු ප්‍රදේශවාසින් සියලු දෙනාට විශේෂ ස්තුතිය පුද කරන බවත්, ගරු සභාපතිතුමා නිවේදනය කරන ලදී. තෙවන කණ්ඩායම මේ වන විට ද සේවාව ලබා දෙමින් සිටින බවද ගරු සභාපතිතුමා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

V. ජෙස්මින්වැලි අධි සනත්ව තේ වගා ව්‍යාපෘතියේ ජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කළ මුදල වූ රු 1100000.00ක මුදල වෙනුවට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් රු 1000000.00ක මුදලක් පමණක් අනුමත වී පැමිණි නිසා සභා කාර්ය මණ්ඩලයේ ද සහය ලබා දීමේ එකඟතාවයකට අනුව ව්‍යාපෘතිය අදාළ කොන්ත්‍රාත්කරුට භාර දුන් බව සභාවේ දැනුවත් වීම සඳහා ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

VI. තවලම ප්‍රාදේශීය සභාව යටතේ ඉදිකරනු ලැබූ මල්ගල්ල ඇල්ලකන්ද පාලම හා ඇලැකුඹුර බෝක්කුව ඉදිකිරිම සඳහා ලැබුණු මුදල් ප්‍රතිපාදනවලට අනුව අසතමේන්තුව සකස් කළ විට මුදල ප්‍රමාණවත් නොවන නිසා එම ඉදිකිරීම් සිදුකර මාර්ගය යථා තත්වයට පත්කර ගැනීමට තවලම ප්‍රාදේශීය සභාවේ ද යන්ත්‍රෝපකරණ හා සේවාව ලබා දීමට සිදු වූ බව සභාවේ දැනුවත් වීම සඳහා ගරු සභාපතිතුමා නිවේදනය කරන ලදී. මේ පිළිබඳ ව ගැටළුවක් පවතීනම් අසතමේන්තුව ලබාගෙන පරික්ෂා කළ හැකි බවද ගරු සභාපතිතුමා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

**04. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**

I. මණ්ඩලපුර මිහිඳු මහ විහාරයේ විහාරාධිපති හිමියන් විසින් ගාලු පළාතේ සංඝනායක පදවිය සම්බන්ධ අක්ත පත්‍ර පූජා මහෝත්සවය පිළිබඳව දැනුවත් කොට එවන ලද 2025.12.8 දිනැති ලිපිය

**05. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**06. යථා පරිදි කල් නොදුන් ප්‍රශ්න**

නැත

**07. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**I. ගරු සභික, සම්පත් ලියනගේ මැතිතුමා**

i. සී/ස හිනිදුම්පත්තු විවිධ සේවා සමුපකාර සමිතියේ 228බී හල්විටිගල ජනපද 1 පියවර ග්‍රාම නිලධාරි වසමේ කැබලි අංක 485 දරණ රජයේ ඉඩමේ පර්චස් 05ක ඉඩම තුළ ඉදිකිරීමට යෝජිත ග්‍රාමීය බැංකුව සහිත දෙමහල් ගොඩනැගිල්ල සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

මෙය ජනතාවට සේවා සපයන රජයේ ආයතනයක් නිසා මෙම ව්‍යාපෘතියට පමණක් එම අනුමත සීමාවෙන් පරිභාහිර ව අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික සුදේශ් රවින්ද්‍ර සමරවික්‍රම මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**II. ගරු සභාපති, සාංචිහාමිලාගේ දේශාන් මධුසංක මැතිතුමා**

i. මණ්ඩලපුර ශ්‍රී මිහිඳු විහාරයේ විහාරාධිපති, අස්ගිරි පාර්ශවයේ ගාලු මහා දිසාවේ ප්‍රධාන සංඝනායක ධූරයෙන් පිදුම් ලබා ඇති නිසා උන්වහන්සේව පිළිගැනීමට එම විහාරයේ දායක කමිටුව 2026 ජනවාරි මස 20 වන දින පින්කමක් සංවිධානය කර ඇති බැවින් ඒ සඳහා සභාවේ ජල බවුසරය, ලී ඇඳි සහිත පුටු ලබා දෙන ලෙසත්, මණ්ඩලපුර පන්සල අසල සිට මණ්ඩලපුර මාර්ගය දෙපස තණකොළ කපා ඉවත් කිරීම හා විහාරස්ථානය අවට විදි පහන් ප්‍රතිසංස්කරණය කරදෙන ලෙසත් ලිඛිතව ඉල්ලා ඇති බැවින් මේ සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරන ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, සිල්වත්ගෙයි සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

ii. තවලම ප්‍රාදේශීය සභාව සතු විදි පහන් සමීක්ෂණ කටයුතු සඳහා වාහනයක් නොමැතිවීම හේතුවෙන් සභාවේ පුස්තකාල සහයක නිලධාරි, නිහාල් හේවාරත්න මහතාගේ වාහනය ලබා දීමට එතුමා ස්ව කැමැත්ත ප්‍රකාශ කළ බැවින් ඒ සඳහා සභාවේ වියදමින් ඉන්ධන සපයා දිය යුතු බවට 2025.11.07 දින රැස් වූ විදි පහන් නඩත්තු කිරීමේ අනු කමිටුවේදී ඒකමතිකව තීරණය වී ඇති නිසා මේ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා කෘ කැබ් රථය තිබියදී වෙනත් වාහනයක් ලබා ගැනීමේ ගැටළුවක් පවතින බව ගරු සභික වන්දන පතිරණ මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

කෘ කැබ් රථයේ තවදුරටත් නිවැරදි කර ගත යුතු දෝෂ කිහිපයක් පවතින බැවින් එය සකස් කර ධාවනයට සුදුසු බවට නිර්දේශය ලබා ගන්නා තෙක් පමණක් මෙම කාර්යයට නිහාල් හෙවාරත්න මහතාගේ වාහනය යොදා ගන්නා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

උක්ත කාල සීමාවට යටත් ව යන සංශෝධනය සහිතව යෝජනාව ස්ථිර කරන බව ගරු සභික පී.ජී.ඩී.සාවිත්‍රි මැතිණිය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

iii. ජෙස්මින්වැලි තේ වගා ක්ෂේත්‍රයට වාර තේ පැළ 4000ක් මිලදී ගැනීමට සිදුව ඇති බැවින් සුදුසු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ එය සිදු කළ යුතු බවට තේ වගා කිරීමේ කටයුතු අධීක්ෂණ අනු කමිටුවේ දී තීරණය වී ඇති නිසා මේ සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, යසන්ත සමීර සේනානායක මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

iv. 2026 ජනවාරි මස යෙදෙන තෛපොංගල් දිනය නිමිත්තෙන් දෙමළ ජනතාවගේ සංස්කෘතික වැදගත්කම ආරක්ෂා කර ගැනීම සඳහා විශේෂ වැඩසටහනක් සභාවේ මුදලෙන් සංවිධානය කිරීමට 2025.11.03 දින රැස් වූ පුස්තකාල හා අධ්‍යාපන අනු කමිටුවේදී ඒකමතිකව තීරණය වී ඇති බැවින් මේ සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, පී.ජී.ඩී.සාවිත්‍රි මැතිණිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

v. 2025දෙසැම්බර් මස 31 සවස සභාවේ සියලු සභික මහත්ම මහත්මීන්ගේ හා කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැදුරු සාජ්ජයක් සභාවේ මුදල් යොදාගෙන පැවැත්වීමට 2025.11.03 දින රැස් වූ පුස්තකාල හා අධ්‍යාපන අනු කමිටුවේදී ඒකමතිකව තීරණය වී ඇති නමුදු මේ වනවිට රටේ විශාල ආපදා තත්වයක් පවතින බැවින් මේ සඳහා අනුමැතිය ලබා දීමට සුදුසු ද යන්න තීරණය කිරීමට ගරු සභාවට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ආපදා තත්වය ඇති වීමට පෙර න්‍යාය පත්‍රයට එකතු කර ඇති නිසා මෙම මුදල් යොදා ගෙන ජනවාරි 01 වෙනිදා දානමය පිංකමක් පවත්වා ඒ ආපදා තත්වයෙන් මිය ගිය අයට

පුණ්‍යා අනුමෝදනා සිදු කිරීමට සුදුසු බවට සංශෝධනයක් එකතු කරමින් එම සංශෝධනය සහිත යෝජනාව ස්ථිර කරන බව ගරු සභික, සම්පත් ලියනගේ මැතිතුමා ප්‍රකාශ කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**08. යථා පරිදි කල් දී නොමැති යෝජනා**

**I. ගරු සභාපති, සාංචිභාමිලාගේ දේශාන් මධුසංක මැතිතුමා**

i. සභා කාර්ය මණ්ඩලයේ ඉදිරි වර්ෂයේ කටයුතු විධිමත් ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන ක්‍රියාකාරී සැලැස්ම-2026, ප්‍රසම්පාදන සැලැස්ම -2026, තිරසාර සංවර්ධන සැලැස්ම- 2026, විගණන සැලැස්ම-2026 හා සභික මහත්ම මහත්මීන්ගේ යෝජනා ඇතුළත් කොට ඉදිරි වර්ෂ 04 ක කාල සීමාවකට සකසනු ලැබූ සිව් අවුරුදු සැලැස්ම සඳහා සභාවේ අනුමැතිය අවශ්‍යවන බවත්, මෙය පරිශීලනයට කාලය අවශ්‍ය වන බැවින් ලබන සභා වාරය තෙක් කාලය ලබා දෙන බවත්, ඒ අනුව ලබන සභා වාරයේ අනුමත කර ගත යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**ii. ආදාහනාගාරයේ නඩත්තු කටයුතු කිරීම සම්බන්ධ යෝජනාව**

ජෙස්මින්වැලි ආදාහනගාරයේ මරණ 175ක් ආදාහන සිදුකර ඇති බැවින් හා අවසන් වරට සම්පූර්ණ නඩත්තු කටයුතු සිදු කරනු ලැබුවේ 2023 වර්ෂයේ බැවින් සේවා සැපයීම නතර කොට නඩත්තු කටයුතු සිදු කළ යුතු වන නිසා, මේ සඳහා මිල ගණන් කැඳවා අවම මිල වූ රණසිංහ ඉලෙක්ට්‍රිකල්ස්හි 841200.00ක මුදලට යටත්ව, ප්‍රතිපාදන මේ වනතෙක් ලැබී නොමැති වුවද සභා අරමුදලෙන් හෝ මෙම නඩත්තු කටයුතු සිදු කළ යුතු බවට ගරු සභාවට යෝජනා කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ආදාහනාගාරයේ වැසිකිළි පද්ධතියට ඉදිරියෙන් තාප්පයක් ඉදි කිරීමට අවශ්‍ය වන බැවින් එම කාර්යයද මේ සමඟ සිදු කරන ලෙසට සංශෝධනයක් ද එකතු කොට එම සංශෝධනය සහිතව යෝජනාව ස්ථිර කරන බව ගරු සභික, සමන් ගමගේ මැතිතුමා ප්‍රකාශ කිරීමෙන් අනතුරුව මෙම යෝජනාවට සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

ඒ සඳහා සම්පූර්ණ වියදම මේ අවස්ථාවේ සභා අරමුදලෙන් දැරිය නොහැකි නිසා අදියරෙන් අදියර මුදල් ප්‍රතිපාදන ලැබෙන හැටි බලා එම කටයුතු සිදු කළ හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**iii. සභා බල ප්‍රදේශය තුළ සිදුකරනු ලබන ඉදිකිරීම් සම්බන්ධ යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 49 හා 50 වගන්ති යටතේ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කරනු ලබන සියලු ඉදිකිරීම් හා මාර්ග සංවර්ධනයන් සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතු බවට යෝජනා කරන බවත්,මෙය නිසියාකාරව බලාත්මක කිරීම තුළින් හදිසි ආපදා නිසා සිදුවන ජීවිත හා දේපළ හානි වළක්වා ගැනීමට හැකියාව ලැබෙන බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, රත්නසිරි ප්‍රියන්ත මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**iv. ග්‍රාමීය හා වතු මාර්ග සංවර්ධනය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල පසු නඩත්තු කටයුතු පැවරීම සම්බන්ධ යෝජනාව**

තවලම ප්‍රාදේශීය බල ප්‍රදේශයේ පිහිටි හල්ලකන්ද කෝවිල අසල මාර්ගය සංවර්ධනය කර අවසන් කොට එහි පසු නඩත්තු කටයුතු සඳහා සභාවට පවරන බව තවලම ප්‍රාදේශීය ලේකම්තුමා ලිඛිතව දැනුම් දී ඇති බැවින් එකී මාර්ගයේ ඉදිරි නඩත්තු කටයුතු සභාව මඟින් සිදු කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, නිශාන්ත නානායක්කාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**v. ජෙස්මින්වැලි තේ වගා ව්‍යාපෘතියේ ජල පොම්පාගාරය ඉදිකිරීම සම්බන්ධ යෝජනාව**

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම- 2025 යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන- සංශෝධන අදාළ ව ජෙස්මින්වැලි තේ වගා ව්‍යාපෘතිය සඳහා ජල පොම්පාගාරයක් ඉදිකිරිමට අනුමත වී ඇති රු 1000000.00ක මුදල යොදවා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු බව ගරු සභාවට යෝජනා කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, යසන්ත සමීර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**vi. මල්ගල්ල 8 කණුව අසල සිට තංගල්ල ඇළ හරහා තිබූ පැරණි පාලමේ ඉවත්කරන ලද කොටස් ඉල්ලීම සම්බන්ධ යෝජනාව**

තවලම ප්‍රාදේශීය සභාවට අයත් මල්ගල්ල 8 කණුව අසල සිට තංගල්ල ඇළ හරහා නව පාලමක් මෙම දිනවල ඉදිකරමින් පවතින නිසා එහි තිබූ පැරණි පාලම එම ප්‍රදේශවාසී එම්.එල්.ඩී.චන්ද්‍රනාත මහතා විසින් තම පුද්ගලික ධනය වැය කොට ඉදිකර ඇති බවට සනාථ කළ හැකි ලේඛන සමඟ එම පාලමේ ඉවත්කළ කොටස් නැවත ඉල්ලීම් කර ලිපියක් සභාවට යොමු කොට ඇති නමුදු, එවකට සිටි ප්‍රාදේශීය ලේකම්තුමා විසින් දැනුම් දී ඇත්තේ මතු දිනෙක රජයේ යම් සංවර්ධන කටයුත්තක් උදෙසා එම ඉදිකිරිම ඉවත් කිරීමට සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් අලාභ ඉල්ලුම් කළ නොහැකි බව බැවින්, එම කොටස් ලබා දීමට සුදුසු ද යන්න තීරණය කිරීමට සභාවට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම කොටස් ලබා දීමට සුදුසු බවට සංශෝධනයක් එක් කරමින් එම සංශෝධනය සහිතව යෝජනාව ස්ථිර කරන බව ගරු සභික සමන් ගමගේ මැතිතුමා ප්‍රකාශ කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**vii. ගෙවීම් සඳහා දෙවන අත්සන්කරු ලෙස නම් කිරීම සම්බන්ධ යෝජනාව**

තවලම ප්‍රාදේශීය සභාව සතු

| | | |
|---|---|---|
| 1. | පොදු ගිණුම | 6765705 |
| 2. | කර්මාන්ත ගිණුම | 75223180 |
| 3. | ආදාහනාගාර ගිණුම | 76096979 |
| 4. | සේවක ණය ගිණුම | 6805059 |

යන ජංගම ගිණුම්හි ගෙවීම්වලට අදාළ චෙක්පත් සඳහා දෙවන අත්සන්කරු ලෙස අත්සන යෙදීමට කාර්ය මණ්ඩලයේ සංවර්ධන නිලධාරි කේ.ජී.නිශාන්ති මහත්මිය හා කළමනාකරණ සේවා නිලධාරි ආර්.කේ.ජනනි චතුරිකා මහත්මිය 2025.12.10 දින සිට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, අජිත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

## viii. 2026 වර්ෂය සඳහා මහ සභා රැස්වීම පැවැත්වෙන දින සම්බන්ධ යෝජනාව

සියලුම මහජන නියෝජිත ආයතන එකම කාල සීමාවකට යටත් ව රැස්වීම පැවැත්වීම සුදුසු බවට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු උපදෙස්වලට අනුව යමින්, පාර්ලිමේන්තුව රැස්වෙන කාල සීමාවේම එනම් මාසයේ පළමු සතියේ හෝ තුන්වන සතියේ දිනයක මහා සභාව පැවැත්වීම සුදුසු බවත්, ඒ අනුව එම සති දෙකෙන් සුදුසු සතියේ දිනය තීරණය කර එය අනුමත කරන ලෙසට ගරු සභාවට යෝජනා කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සභික මහත්ම මහත්මීන්ගේ අදහස් වලට අනුව සෑම මසකම තුන්වන සතියේ බදාදා දින මේ සඳහා සුදුසු බවත්, එම අදාළ දිනය රජයේ නිවාඩු දිනයක් වේ නම් ඊට පසු දිනයේ මහ සභාව රැස්වීම අනිවාර්ය වන නිසා පහත නම් කළ දිනයන් ඒ අනුව යොදා ගන්නා බවත්, දෙසැම්බර් මාසයේ පමණක් නත්තල් උත්සවය නිසා දිනය සංශෝධනය කරන බවත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

- ජනවාරි **21**
- පෙබරවාරි **19**
- මාර්තු **18**
- අප්‍රේල් **22**
- මැයි **20**
- ජුනි **18**
- ජූලි **22**
- අගෝස්තු **19**
- සැප්තැම්බර් **23**
- ඔක්තෝබර් **21**
- නොවැම්බර් **18**
- දෙසැම්බර් **22**

මෙම යෝජනාව ගරු සභික, අමිල අබේගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

## ix. 2026 වර්ෂය සඳහා කමිටු පිහිටුවීමේ යෝජනාව

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තිය යටතේ 2025 ජුනි මස සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ගනු ලැබූ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව, පරිසර හා පහසුකම් කමිටුව, කාර්මික සේවා කමිටුව හා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව යන ප්‍රධාන කමිටු 4 සහ එහි සංයුතිය 2026 වර්ෂයට ද එම ආකාරයෙන් බලාත්මක කරන බවත් ඒ සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, නිශාන්ත නානායක්කාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

## x. 2026 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධ යෝජනාව

තවලම ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයට අදාළ ව භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු සභික, නිශාන්ත නානායක්කාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**09. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම**

- 2025 නොවැම්බර් මාසයට අදාළ ලැබීම් ගෙවීම් සාරාංශය ඉදිරිපත් කරන ලදී.
- 2025.11.04 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදී.
- 2025.11.25 දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදී.
- 2025.11.25 දින පැවැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදී.
- 2025.11.25 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**10. නොපැමිණි සභික මහත්ම මහත්මින්ගේ නිවාඩු අනුමත කිරීම.**

නැත

**11. වවුචර් අනුමත කිරීම.**

**i. තවලම සහා බල ප්‍රදේශයේ මාර්ගවල දෙපස තණකොළ කැපීම සඳහා ගෙවීම**

තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සතු මාර්ගවල දෙපස තණකොළ කපා පිරිසිදු කිරීම සඳහා කිලෝමීටරයකට රු ක් ගෙවීමට කොන්ත්‍රාත් පදනම මත එච්.ඒ. ජයන්ත මහතාට ලබා දී තිබූ බැවින් ඔහු මේ වන විට මාර්ග තුනක එනම්

- හිංගල්ගොඩ අත්කම් නිවාස මාර්ගය අශෝකාරාමය දක්වා - 3.7km
- කන්නෙලිය මාර්ගය - 1.5km
- මණ්ඩලපුර හතර පියවර මාර්ගය - 3.4km

එම කටයුතු අවසන් කර අදාළ මුදල් ලිඛිතව ඉල්ලීම් කර ඇති බැවින් එම මුදල් ගෙවීමට මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

මෙම මාර්ගවල අඩුපාඩු පවතින බවට විවිධ අදහස් පළ වූ බැවින් ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේ තම අධීක්ෂණයක් සිදු කොට අඩුපාඩු පවතීනම් ගෙවීම් සිදු කිරීමට පෙර පෙන්වා දෙන බවයි.

මෙම යෝජනාව ගරු සභික, සමන් ගමගේ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**ii. ආරක්ෂිත කැමරා පද්ධතිය සවිකිරීම සඳහා ගෙවීම**

තවලම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, ආදාහනාගාරය හා ඕපාත උප කාර්යාලය සඳහා මේ වන විට ආරක්ෂිත කැමරා 16කින් යුත් කැමරා පද්ධතියක් සවිකර එහි සියලු කටයුතු අවසන් කර ඇති බැවින්, ඒ සඳහා ගෙවීමට ඇති රු 669770.00ක මුදල ගෙවීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව ගරු සභික, රත්නසිරි ප්‍රියන්ත මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

**12.** **ඇස්තමේන්තු අනුමත කිරීම**

නැත

**13.** **වෙනත්**

**I. 2026 අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම හා සම්මත කිරීම**

- **සභාපතිතුමාගේ අයවැය පණිවිඩය**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ හිනිදුම මැතිවරණ කොට්ඨාසයේ පිහිටි සුන්දර ප්‍රදේශයක් වන තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය භූමියෙන් වර්ග කිලෝමීටර් 188.8ක් පුරා පැතිරුණු ජනගහනය 35000ක් පමණ වන ගිං ගඟ මිටියාවතේ පිහිටි භූමියෙන් මෙන්ම මානව සම්පතින් සාරවත් ප්‍රදේශයක් බවත්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් තවලම ප්‍රාදේශීය සභාව ස්ථාපනයකර ඇති අතර, ඒ යටතේ උප කාර්යාලයක්, පුස්තකාල දෙකක්, ආයුර්වේද මධ්‍යස්ථානයක් හා ආදාහනාගාරයකින් ද මේ වන විට අප ප්‍රාදේශීය සභාව සමන්විත බව ප්‍රකාශ කරන ලදී.

2025 ජුනි 02 වන දින ජාතික ජන බලවේගයේ පාලනයක් ආරම්භ කරමින් පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගොඩනැගීම සඳහා වූ නව රජයේ දැක්මට අනුව පුනරුදයේ පුරවරයක් ලෙස තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ගොඩනැගීම ආරම්භ කර ඇති බවත්, ඒ අනුව ස්වාභාවික පරිසර පද්ධතිය රැක ගනිමින් මෙහි ජීවත්වන ජනතාවගේ දිළිඳුකම පිටුදැකීම සඳහා වූ යටිතල පහසුකම් සංවර්ධනය හා නවීන තාක්ෂණය සමඟ මුසු වූ නව ආර්ථික අවස්ථාවක් ඇති කරමින් ජනතාවගේ ජීවන් තත්වය නඟා සිටුවුමේ මෙහෙවර ආරම්භ කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව, ඉදිරි අයවැය වර්ෂය තුළ නව රජයේ clean sri lanka වැඩ පිළිවෙල සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරමින් පිරිසිදු ප්‍රාදේශීය සභාවක් මෙන්ම ගුණගරුක මිනිසුන්ගෙන් සපිරි සමාජයක් බිහිකරලීම අපගේ අරමුණ බවත්, ඩිජිටල්කරණය අනුව යමින් කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් මෙම ප්‍රදේශයේ ජනතාවට ලබා දීමට කැපවී සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

2026 වර්ෂය තවලම ප්‍රාදේශීය සභාව පුනරුදයේ පුරවරයක් බවට පත්කරලීමේ අඩිතාලම සපයන වර්ෂය වේවායි ප්‍රර්ථනා කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- **සභාපතිතුමාගේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය**

තවලම ප්‍රාදේශිය සභාවේ නව සභික ධූර කාලය 2025.06.02 දිනෙන් ආරම්භ වීමෙන් පසු නව දැක්මක් යටතේ පත්වුණු නව ප්‍රාදේශිය සභා පාලනය තුළ ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ණ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ ප්‍රාදේශිය සභාවේ කටයුතු විධිමත් ලෙස හා මනා පාලනයෙන් යුතුව ක්‍රියාත්මක වන අතර ඒ තුළින් බල ප්‍රදේශයේ ජනතාවට ඉටු විය යුතු සේවාවන් වඩා ප්‍රශස්ත ලෙස ඉදිරි වර්ෂයේදී ද ඉටු කිරීම උදෙසා 2026 වර්ෂය සඳහා වූ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය මෙසේ ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විවිධ සමාජ තලයන් නියෝජනය කරන පුද්ගලයන්ගෙන් ලබාගත් යෝජනා හා අදහස් සැලකිල්ලට ගනිමින් 2026 වර්ෂයේදී මහජන අවශ්‍යතා ඉටුකිරීම වෙනුවෙන් පහත ප්‍රතිපත්තිමය තීරණවලට එළඹි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

රටේ පැවති ආර්ථික අර්බුදතා මග හරිමින් ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් පවතින මේ යුගයේ මහජනතාවට “පොහොසත් රටක් ලස්සන ජීවිතයක්” උදාකරලීම උදෙසා ප්‍රදේශයේ යටිතල පහසුකම් දියුණු කිරීම (ග්‍රාමීය ප්‍රවේශ මාර්ග නවීකරණය, පටු මාර්ග පුළුල් කිරීම, කොන්ක්‍රීට් කිරීම) ප්‍රතිපත්තියක් ලෙස තීරණය කර ඇති බවත්,

මෙම ග්‍රාමීය ප්‍රවේශ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේදී ඊට ගැලපෙන කාණු පද්ධතියක් සකස් කිරීම, කොන්ක්‍රීට් කිරීම, කොන්ක්‍රීට් කැට ඇතිරීම, හියුම් පයිප්ප යොදා බෝක්කු ඉදි කිරීම, ග්‍රාමීය පාලම් යටතේ පාලම් ඉදි කිරීම ඉදිරි අයවැය වර්ෂය තුළදි ද නොකඩවා ඉදිරියට කරගෙන යාමට තීරණය කර ඇත. 2026 පළාත් පාලන සංවර්ධන සැලැස්ම යටතේ ගරු ආණ්ඩුකාරතුමාගේ වැය ශිර්ෂය යටතේ අවශ්‍ය මුදල් අපේක්ෂා කරන බවත්,

තවද, බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ඉටු කිරීමට ප්‍රමාණවත් මූල්‍ය ශක්තිය අප සභාවට නොමැති බැවින් නව ආදායම් ව්‍යාපෘති ආරම්භ කර ඒ තුළින් උත්පාදිත ආදායම් මගින් හා විමධ්‍යගත අයවැය හා රේඛීය අමාත්‍යාංශය මඟින් ලැබෙන ප්‍රතිපාදන යොදවා සංවර්ධන යෝජනා ඉටු කිරීමට කටයුතු කිරීම ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බල ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා හඳුනාගෙන ඒ සඳහා ජලය බෙදාහරින ව්‍යාපෘති ආරම්භ කිරීමට සැලසුම් සකස් කර ඒ තුළින් විසඳුම් ලබා දීමේ ප්‍රතිපත්තියට එළඹ ඇති බවත්,

කසල කළමනාකරණය විධිමත් කිරීම සඳහා නව කසල කළමනාකරණ ව්‍යාපෘති ආරම්භ කර ඒ තුළින් සභාවට ආදායම් උපයාගත හැකි මාර්ගයන්ට එළඹීමට තීරණය කර ඇති බවත්,

මෙම අයවැය මඟින් කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්,

වැඩසටහන් අනුව ගමන් වියදම්, සැපයුම් හා උපකරණ, ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව, ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා යටතේ අවශ්‍ය ප්‍රමාණයට ප්‍රතිපාදන වෙන්කර ඇති බවත්,

සභාව සතු වාහන නඩත්තුව හා අලුත්වැඩියාව සඳහා වැඩි ප්‍රතිපාදනයන් වෙන් කිරීම සිදු කර ඇති බවත්,

බල ප්‍රදේශය පුරා විහිදී ඇති වීදි පහන් සියල්ල ක්‍රමවත්ව නඩත්තු කිරීමට ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

“ උතුම් සැපය නිරෝගීකමයි” යන තේමාව යටතේ බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්වය නංවාලීමේ අරමුණින් තවලම ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා වසර මුළුල්ලේම ඖෂධ හා උපකරණ ලබා දීමටත්, ප්‍රාදේශීය සෞඛ්‍ය නිළධාරී සමඟ එක්ව ඩෙංගු, ජලභීතිකා වැනි රෝග නිවාරණ වැඩසටහන් තවදුරටත් කරගෙන යාමටත්, තීරණය කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පරිසර වැඩසටහන් යටතේ, ජාතික පරිසර දිනය සැමරීම, ජාතික රුක්රෝපණ දින වැඩසටහන්, කසල කළමනාකරණය සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම, ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවත්,

කියවීම තුළින් මිනිසා සම්පූර්ණ කරයි, යන්න මුල්කර ගනිමින් ජාතික කියවීම් මාසය තුළ පාසල් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාඨක සමාජ පිහිටුවීම, නව සාමාජිකයින් බඳවා ගැනීම සඳහා තරඟාවලි පැවැත්වීම, පුස්තකාල සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට යෝජනා කර ඇති බවත්,

තවදුරටත් දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා ලෝක ළමා දිනය මුල්කර ගනිමින් වැඩසටහන්, දරුවන් සඳහා දැනුම මිනුම තරඟ, චිත්‍ර තරඟ, රචනා තරඟ පැවැත්වීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවත්, මේ සඳහා විවිධ පරිත්‍යාගශීලීන්ගේ ආධාර ද බලාපොරොත්තු වන බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මහජන උපයෝගීතා හා සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ආදායම් සඳහා ආයතනික ආධාරයන්ට අමතරව සභාවෙන් ආදායම් උත්පාදනය කර ගන්නා බවත්,නව අධි සනත්ව ආදර්ශ තේ වගා ව්‍යාපෘතිය තුළින් 2026 වර්ෂයේ ස්වයං උත්පාදිත ආදායම ඉහළ නැංවීමට අපේක්ෂා කරන බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාරික හා කර්මාන්ත වලින් අයකරන බදු හා බලපත්‍ර ගාස්තු වටිනාකම ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව සංශෝධනයට ලක් කිරීමට යෝජනා කරන බවත්,

බල ප්‍රදේශයේ හිඟව පවතින අක්කර බදු අය කර ගැනීමට ඉඩම් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය මෙම වර්ෂයේ ද සිදු කිරීමට යොජනා කරන බවත්,

අප සභාවට ලැබිය යුතු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු ආදායම පෙර පරිදිම අයවැය වර්ෂය තුල අය කර ගැනීමට යෝජනා කරන බවත්,

තානායම් හා නිවාඩු නිකේතනවල වාර්ෂික ආදායම මත වන 1% ක බද්ද පවත්නා වර්ෂයේදී මෙන්ම අයවැය වර්ෂයේදීද අයකිරීමට යෝජනා කරන බවත්,

ආදර්ශ නාම පුවරු හා බැනර් වලින් අයකරන ගාස්තුව ඉදිරි අයවැය වර්ෂයේදී ද යම් ක්‍රමවේදයකට අනුව අය කිරීමට යෝජනා කරන බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තවලම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු දීම තුලින් මෙතෙක් අය කරන ලද බදු මුදල අයවැය වර්ෂය තුළ නව තක්සේරු වටිනාකම අනුව අය කිරීමට යෝජනා කරන බවත්,

ආයුර්වේද තොග ආධාර ද වර්ෂය තුළ ලබා ගැනීමට යෝජනා කරන බවත්,

සභාවට අයත් ක්‍රීඩා පිටි හා දේපල වෙනත් පාර්ශවයකට භාවිතය සඳහා ලබා දීමේදී යම්කිසි බදු මුදලක් අය කිරීම ආරම්භ කල අතර, 2026 වර්ෂයේදී එය ක්‍රමවත්ව ඉටු කිරීමට යෝජනා කරන බවත්,

ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති වාහන හා යන්ත්‍ර සූත්‍ර සියල්ල වාර්ෂික ගැසට් පත්‍රය පළකරන පරිදි බල ප්‍රදේශයේ ජනතාවට හා පිටස්තර ජනතාවට කුලී පදනම මත ලබා දීමට තීරණය කර ඇති බවත්, ඒ යටතේ විශාල මුදලක් සභාව වෙත ලබා ගැනීමට ක්‍රියා කිරීම අරමුණ වී ඇති බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බල ප්‍රදේශ පුරා සංවර්ධන ඉලක්ක ජය ගැනීම සඳහා පහත සඳහන් ආයතනික ප්‍රතිපාදන අප විසින් අපේක්ෂා කරන අතර. එම ප්‍රතිපාදන ලබා ගෙන අප සභාවේ යෝජනා ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගන්නවා ඇති බවත්, ඒ යටතේ,

1. පළාත් නිශ්චිත ප්‍රදාන
2. උපමාන පාදක ප්‍රදාන
3. පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන
4. දිස්ත්‍රික් මන්ත්‍රී ප්‍රතිපාදන
5. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ විශේෂ ප්‍රතිපාදන
6. වෙනත් ආයතනික ආධාර

ලබා ගැනීමට අපේක්ෂා කරන බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- **2026 අයවැය වාර්තාව පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම**

**ගරු සභික, සුදේශ් රවීන්ද්‍ර සමරවික්‍රම මැතිතුමා**

තවලම ප්‍රාදේශීය සභාව තුළ ආගමික හා සංස්කෘතික පුනර්ජීවයක් ලබා දීමේ වැඩසටහනක් අයවැය ලේඛනයට ඇතුළත් නොවීම පිළිබඳ ව කණගාටුව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභික, සම්පත් ලියනගේ මැතිතුමා**

2026 අයවැය ලේඛනයට කෙටුම්පතෙහි සඳහන් ව තිබූ කරුණු සංශෝධනය කොට ඇතුළත් කර ඇති බවත්, පනංගල බටහිර කොට්ඨාසයට කිසිදු වැඩසටහනක් ඇතුළත් කොට නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු උපසභාපති, ගාමිණී කරුණාරත්න මැතිතුමා**

මෙම 2026 අයවැය  ලේඛනය තවලම පුරවරය ගොඩ නැගීමට සකස් කළ වැදගත් අයවැයක් බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභික, යසන්ත සමීර මැතිතුමා**

තවලම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ කොට්ඨාස ලෙස බෙදා වෙන් නොකොට සාමූහිකව තවලම පුරවරය ගොඩනැගීමට මෙම අයවැය  ලේඛනය සකස් කොට ඇති බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභික, නිශාන්ත නානායක්කාර මැතිතුමා**

තවලම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ සෞඛ්‍ය හා යටිතල පහසුකම් දියුණු කිරීමට මෙන්ම ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට කරන ලද යෝජනා අයවැය ලේඛනයට ඇතුළත් කොට ඇති බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභික, රත්නසිරි ප්‍රියන්ත මැතිතුමා**

අයවැය කෙටුම්පත් සාකච්ඡාවේදී වූ යෝජනා සංශෝධන ලෙස අයවැය වාර්තාවට එකතු කර ඇති බවත්, නව රජයේ දැක්ම වන 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' අනුව යමින් තවලම ප්‍රාදේශීය ජනතාවට යහපත් ජීවිතයක් උදා කරලීමට මෙම අයවැය ලේඛනය සකසා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභික, දර්ශනී සාවිත්‍රී මැතිණිය**

තවලම බල ප්‍රදේශය පුනරුද පුරවරයක් ලෙස ගොඩනැගීමට සකසන ලද සාර්ථක අයවැය ලේඛනයක් බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපති,** සාංවිභාමිලාගේ දේශාන් **මධුසංක මැතිතුමා**

ප්‍රාදේශීය සභාව හා එහි කටයුතු පාර්ලිමේන්තුවේ හා පළාත් සභාවේ කටයුතු වලට වඩා වෙනස් වන බවත්, සභාවට තේරී පත්ව ආ සියලු දෙනා මෙහි උන්නතිය වෙනුවෙන් වැඩ කටයුතු සිදු කිරීමට බැඳී සිටින බවත්, තවලම ප්‍රාදේශීය සභාව උපයා ගන්න ආදායමට පමණක් ස්වාධීන අයවැයක්  සකස් කිරීමට තරම් දියුණු නොවන බැවින් මෙම අයවැය ලේඛනය සකස් කිරීමේදී රජයෙන් ලැබෙතැයි සිතන ප්‍රතිපාදන ද අයවැය ලේඛනයට ඇතුළත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. 2026 අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීමට හා සංශෝධනය කිරීමට මහ සභා වාර දෙකකදී අවස්ථාව ලබා දුන් බැවින් එමඟින් ලැබුණු යෝජනාවලට අනුව එම කෙටුම්පත සංශෝධනය කොට මෙම අයවැය ලේඛනය සකසා ඇති බවත්,

ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙම අයවැයට එකතුකළ හැකි නව ආදායමක් වර්ෂය මැදදී සභාවට එකතු වේ නම් නැවත අයවැයක් ඉදිරිපත් කළ හැකි බවත්, එවිට තව යෝජනා ඇතුළත් කිරීමට අවස්ථාව ලබා දිය හැකි බවත්, ප්‍රකාශ කරන ලදී.

- **අයවැය සම්මත කිරීම**

ඉදිරි වර්ෂය තුළ මෙම ප්‍රදේශයේ ජනතාව සමඟ ලස්සන ප්‍රදේශයක් නිර්මාණය කිරීමට කරනු ලබන විශාල වැඩ කොටසේ අඩිතාලම මෙම අයවැය තුළින් පෙන්වා දී ඇති බැවින්, 2026 වර්ෂයට අදාළ අයවැය වාර්තාව සම්මත කරන ලෙසට සියලු දෙනාගෙන් ඉල්ලා සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අයවැය සම්මත කිරීමට බෙදීමක් අවශ්‍ය බව ගරු සභික, සම්පත් ලියනගේ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු සභික, සුදේශ් රවින්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව බෙදීමක් සිදු විය. ඒ අනුව 2026 අයවැය වාර්තාවට පක්ෂව ඡන්ද 10කුත් විපක්ෂව ඡන්ද 09කුත් ලැබුණු අතර වැඩි ඡන්ද 01කින් සම්මත විය.

## II. පසුගිය සභාවේදී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය සමාලෝචනය කිරීම

බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධ යෝජනාව ගැසට් පත්‍රයේ පළකිරීමට ඉදිරිපත් කොට එම කටයුතු සම්පූර්ණ කර ඇති බවත්, ඕපාත පුස්තකාලයේ ගොඩනැගිල්ල සංවර්ධනය කිරීමේ හා මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය මේ වනවිට ආරම්භ කර ඇති බවත්, එය නියමිත දිනට අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇති බවත්, මාර්ග පිළිසකර කිරිමේ ව්‍යාපෘතියට අදාළ ව බැකෝ යන්ත්‍රය නැවත අකර්මණ්‍ය වී ඇති නිසා ඉදිරියේදී එම කටයුතු සිදු කිරීමට නියමිත බවත්, දාම්මල පාසල් මාවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මේ වන විට ආරම්භ කර ඇති බවත්, අපහරණය කළ යුතු වාහන මේ වර්ෂය අවසාන වීමට පෙර අපහරණය කිරීමට නියමිත බවත්, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම මේ වනවිට අවසන්කර ඇති බවත්, තවලම ප්‍රාදේශීය සභාවට ජලය ලබා ගැනීමේ ව්‍යාපෘතියට අනුව නළ ළිඳක් කැණීම් කටයුතු සිදුකර එය සාර්ථක වී ඇති බවත්, ගරු සභාපතිතුමා පසුගිය සභා තීරණ සමාලෝචනය කරමින් ප්‍රකාශ කරන ලදී.

සහභාගී වූ සියලු දෙනාට ස්තුති කොට 2025 වර්ෂයට අදාළ ව පැවැත්වුණු අවසාන මහ සභා වාරය ගරු සභාපතිතුමා විසින් ප.ව. 12.40ට අවසන් කරන ලදී.

සභාපති
තවලම ප්‍රාදේශීය සභාව.

සංශෝධන රහිතව 2025 **දෙසැම්බර් මස 09** වන දින සභා වාර්තාව සම්මත විය යුතු බවට ගරු සභාපති, සංචිහාමිලාගේ දේශාන් මධුසංක මැතිතුමා විසින් කළ යෝජනාව ගරු සභික, නිශාන්ත නානායක්කාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ ඒකමතික අනුමැතිය ලැබුණි.

සභාපති
තවලම ප්‍රාදේශීය සභාව.